# ගණිත ඔලිම්පියාඩ් තරගාවලිය 2023

## පළාත් මට්ටමේ පුහුණු සංචිතයට තෝරා ගැනීමේ පරීක්ෂණය - දකුණු පළාත

**පොදු උපදෙස් :**

- ★ ප්‍රශ්න 20ට ම පිළිතුරු සපයන්න.
- ★ එක් එක් ප්‍රශ්නය යටතේ ඇති තිත් ඉර මත පිළිතුරු සැපයිය යුතු අතර <u>ඒකක සඳහන් කළ යුතු අවස්ථාවල අනිවාර්යෙන්ම පිළිතුරු යටතේ ඒකක ද සඳහන් කළ යුතු බව සලකන්න.</u>
- ★ රූපසටහන් ඇඳ ඇත්තේ පරිමාණයට ම නොවේ.

| | | |
|---|---|---|
| විභාග අංකය | : | ............................................ |
| නම | : | ............................................ |
| පාසල | : | ............................................ |
| ශ්‍රේණිය | | ............................................ |

කාලය : පැය 1

01. අනිල් එකක් 100 g ක් බැගින් ස්කන්ධයක් ඇති දත්බෙහෙත් ටියුබ් 80 ක් මිලට ගන්නා ලදී. එයින් එකක ස්කන්ධය අනෙක් ඒවාට වඩා අඩුය. තැටි තරාදියක් භාවිතයෙන් එම අඩු ස්කන්ධයක් සහිත දත්බෙහෙත් ටියුබය තෝරාගැනීමට හැකිවන පරිදි තැටි තරාදිය භාවිතා කළ යුතු අවම වාර ගණන කීයද ? පිළිතුර : ............................

02. 

මෙම රූපයේ සෘජුකෝණාස්‍ර කීයක් තිබේද ?

පිළිතුර : ............................

03. 300 ට අඩු 5 න් හා 7 න් යන සංඛ්‍යා දෙකෙන්ම බෙදෙන සංඛ්‍යා ගණන කීයද ? පිළිතුර : ............................

04. 

මෙම රූපයේ ඇති සමචතුරස්‍ර ගණන කීයද ?

පිළිතුර : ............................

05. අමල් සතියේ සඳුදා, බදාදා, බ්‍රහස්පතින්දා සහ ඉරිදා ඇත්ත කියයි. කමල් සතියේ සඳුදා, අඟහරුවාදා, බදාදා සහ බ්‍රහස්පතින්දා ඇත්ත කියයි. දෙදෙනාම ඊයෙ මම කිව්වෙ බොරු කියන ප්‍රකාශය කිව හැකි දිනය තෝරන්න.

Mon, Tue, Wed, Thu, Fri, Sat, Sun

පිළිතුර : ............................ day

06. 16, 13, 10, 8 යන සංඛ්‍යා 4 සලකන්න. එම 4 න් ඕනෑම 2 ක් බැගින් එකතු කරන්න. එයින් ලැබෙන විශාල පිළිතුරෙන් කුඩා පිළිතුර අඩු කරන්න. ලැබිය හැකි එකිනෙකට වෙනස් පිළිතුරු ගණන කීයද ? පිළිතුර : ...............

07. කූඩයක පලතුරු තුන් වර්ගයක් තිබේ. එයින් 21 ක් හැර අනෙක්වා ජම්බුය. 23 ක් හැර අනෙක්වා දොඩම්ය. 26 ක් හැර අනෙක්වා අඹ වේ. වට්ටියේ තිබෙන ජම්බු ගෙඩි ගණන කීයද ? පිළිතුර : ............................

08. $29 \times 37 \times 21 \times 55 \times 43 \times 39$ ගුණිතයේ එකස්ථානයේ තිබෙන සංඛ්‍යාව කුමක්ද ? පිළිතුර : ............................

09. 2, 3, 5, 7 යන සංඛ්‍යා භාවිත කරමින් සංඛ්‍යාංක 2 කින් යුත් ප්‍රථමක සංඛ්‍යා කීයක් සෑදිය හැකිද ? පිළිතුර : .............

10. $(2 \times 3 \times 5 \times 7)\left(\frac{1}{2}+\frac{1}{3}+\frac{1}{5}+\frac{1}{7}\right)$ සුළු කරන්න. පිළිතුර : ............................

11. 5021972970 යන සංඛ්‍යාව ලියූ කඩදාසි පටිය දෙපලකින් කපා සාදා ගන්නා සංඛ්‍යා තුනෙහි එකතුවට තිබිය හැකි කුඩාම අගය කුමක්ද ? පිළිතුර : ............................



Maths Division SPED
LIVEWORKSHEETS

12. සංඛ්‍යාංක 4 කින් යුත් සංඛ්‍යාවක් සැලකූ විට වමේ සිට දකුණට අනුයාත ඉලක්කම් සහ ඒවා ආරෝහණ පිළිවෙළට තිබෙන සංඛ්‍යාංක වන සේ වූ සංඛ්‍යා කීයක් ලිවිය හැකි ද ?

පිළිතුර : ..............................

13. පහත jigsaw ප්‍රහේලිකාවේ කොටස් 5 නිසි ලෙස සම්බන්ධ කිරීමෙන් ලැබෙන සුළු කිරීම සිදු කළ විට පිළිතුර වන්නේ කුමක්ද ?




පිළිතුර : ..............................

14. ශිෂ්‍යයෙක් සංඛ්‍යාංක 2 කින් යුත් සංඛ්‍යා 2 ක් එකතුකොට වම්පස දැක්වෙන නිවැරදි පිළිතුර ලබා ගන්නා ලදී. එම සංඛ්‍යාංකම සහිත සංඛ්‍යා 4 කින් යුත් සංඛ්‍යා 2 ක් දකුණු පස එකතු කොට ඇත. එහි පිළිතුර විය හැක්කේ කුමක්ද?

```
  A B          A D C B
+ C D        + C B A D
-----        ---------
1 3 7            ?
=====        =========
```

පිළිතුර : ..............................

15. ඍජුකෝණාස්‍රාකාර චොකලට් එකක් සමාන සමචතුරස්‍ර කැබලිවලින් යුක්තය. නිමල් එයින් සම්පූර්ණ පටි 2 ක් කඩා ගෙන කුඩා සමචතුරස්‍රාකාර කැබලි 12 ක් කෑමට ගත්තේය. ඉන්පසු, ජගත් ඉතිරියෙන් චොකලට් පටියක් කඩා කුඩා සමචතුරස්‍රාකාර කැබලි 9 ක් කෑමට ගත්තේය. චොකලට් එකෙහි කුඩා සමචතුරස්‍රාකාර කැබලි කීයක් ඉතිරි වේද ?

පිළිතුර : ..............................

16. 13 cm ක් දිග 4 cm ක් පළල කඩදාසි පටියක් රූපයේ පරිදි නවා ඇත. එවිට ලැබෙන P හා Q ඍජුකෝණාස්‍රවල වර්ගඵල අතර සම්බන්ධය $P = 2Q$ වේ. $x$ හි අගය සොයන්න.




පිළිතුර : .............................. cm

17. හරිනි සතුව කුඩා සමාන ඉටිපන්දම් 10 ක් ඇත. එයින් එකක් දැල්වී අවසන් වීමට මිනිත්තු 2 ක් ගතවේ. ඇය එක් ඉටිපන්දමක් දල්වා එහි $\frac{1}{10}$ ක් ඉතිරිව තිබිය දී දෙවැන්න දල්වයි. දෙවැන්නේ $\frac{1}{10}$ ක් ඉතිරිව තිබිය දී තෙවැන්න ආදී වශයෙන් ඉටිපන්දම් 10 දල්වයි. එම සියල්ල දැල්වී අවසන් වීමට කොපමණ වේලාවක් ගතවේ ද ?

පිළිතුර : ..............................min ......s

18.

```
  A B B B
+     A C
---------
  2 0 2 3
=========
```

නම් $(A + B + C)$ හි අගය කීයද ?

පිළිතුර : ..............................

19. 

පන්තියට ආ ගුරුතුමිය 1 සිට 8 දක්වා සංඛ්‍යා හැඩතල තුළ ලිවීය.

 තුළ ඇති සංඛ්‍යාවල එකතුව 10 ද,

 තුළ ඇති සංඛාවල එකතුව 20 ද වේ.

 තුළ ඇති සංඛ්‍යාව කීයද ?

පිළිතුර : ..............................

20. විකිණීමට තබා ඇති සෝෆා කට්ටලයක මිනුම් පහත දැක්වේ. $x$ සොයන්න.




පිළිතුර : .............................. cm

Maths Division SPED



wasanthaweerakoonbandara@gmail.com
Liveworksheet created by wasantha bandara
LIVEWORKSHEETS